අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்லை, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

| | | |
|---|---|---|
| මගේ යොමුව / எனது இல. / My Ref. ED/019/12/12/07/08 | ඔබේ යොමුව / உமது இல. / Your Ref. | දිනය / திகதி / Date 2023.04. 25 |

චක්‍රලේඛ අංක : 17/2023

පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාස භාර නියෝජ්‍ය / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම පාසල්වල විදුහල්පතිවරුන් වෙත,

## පාසල්වල 2 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා සිසුන් ඇතුළත් කිරීම

පාසල්වල 2 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් මෙයට පෙර නිකුත් කර ඇති 2008.09.19 දිනැති අංක 2008/37 චක්‍රලේඛය, 2018.02.16 දිනැති අංක 03/2018 හා 2019.06.26 දිනැති 33/2019 දරන චක්‍රලේඛ සංශෝධනයන්හි උපදෙස් අභිබවා මෙම චක්‍රලේඛයේ උපදෙස් 2 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා සිසුන් ඇතුළත් කිරීමේ දී මින් ඉදිරියට බලපවත්වනු ඇත.

**2.0 පන්තියක ශිෂ්‍ය සංඛ්‍යාව හා ශ්‍රේණියක සමාන්තර පන්ති සංඛ්‍යාව**

2.1 පාසල්වල 2 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා එක් පන්තියක ශිෂ්‍ය සංඛ්‍යාව අමප අංක 22/1960/607/079 හා 2023.01.03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පහත සඳහන් පරිදි විය යුතු ය.

(අ) 2 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා එක් පන්තියක ශිෂ්‍ය සංඛ්‍යාව 40ක් වේ.

(ආ) 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා එක් පන්තියක ශිෂ්‍ය සංඛ්‍යාව 45ක් වේ.

දැනටමත් පන්තියක ශිෂ්‍ය සංඛ්‍යාව ඉහත (අ) සහ (ආ) හි සංඛ්‍යා ඉක්මවා ඇත්නම් එම පන්තිවලට අලුතින් සිසු සිසුවියන් ඇතුළත් නො කළ යුතු ය.

2.2 ශ්‍රේණියක පවත්වා ගත යුතු සමාන්තර පන්ති සංඛ්‍යාව පහත පරිදි විය යුතු ය.

(අ) 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා සෑම ශ්‍රේණියක් සඳහා ම සමාන සමාන්තර පන්ති සංඛ්‍යාවක් පවත්වා ගත යුතු අතර පහත සඳහන් (ආ) අවස්ථාවේ දී හැර, සෙසු සෑම අවස්ථාවක දී ම 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා සෑම ශ්‍රේණියක් සඳහා ම සමාන සමාන්තර පන්ති සංඛ්‍යාවක් පවත්වා ගත යුතු ය.

(ආ) ක්‍රීඩා පාසලක් වශයෙන් නම් කර ඇති පාසල්වල පමණක් අදාළ චක්‍රලේඛයට අනුකූල ව ක්‍රීඩා කටයුතු සඳහා සුදුසුකම් ලබන සිසුන් වෙනුවෙන් පන්තියක් 8 ශ්‍රේණියේ දී ආරම්භ කළ හැකි ය. මේ අයුරින් පන්තියක් වැඩි කරන්නේ නම් එම පන්තිය සමඟ ඇති වන සමාන්තර පන්ති සංඛ්‍යාව 11 ශ්‍රේණිය දක්වා පවත්වා ගෙන යා යුතු ය.

(ඇ) ජාතික පාසලක් නම්, අධ්‍යාපන අමාත්‍යාංශ ව්‍යුහ කමිටුවේ ද පළාත් පාසලක් නම්, පළාත් ව්‍යුහ කමිටුවේ ද තීරණයක් නොමැති ව පන්ති/සමාන්තර පන්ති සංඛ්‍යාව වෙනස් නො කළ යුතු ය.

(ඈ) යම් ශ්‍රේණියක් සඳහා සමාන්තර පන්ති පවත්වා ගෙන යාමේ දී පන්තියක ශිෂ්‍ය සංඛ්‍යාව සම්පූර්ණ වන පරිදි අවම සමාන්තර පන්ති සංඛ්‍යාවක් පවත්වා ගත යුතු ය.

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister — +94112784832, +94112784825, minister.education@moe.gov.lk
ලේකම් / செயலாளர் / Secretary — +94112784811, +94112785162, secretary.education@moe.gov.lk

**3.0 6 ශ්‍රේණිය හැර, 2 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා පන්තිවලට සිසුන් ඇතුළත් කිරීම.**

3.1 සිසුන් ඇතුළත් කිරීමට සලකා බලනු ලබන කාණ්ඩ

පාසලක පන්තියක/පන්තිවල පුරප්පාඩු පවතින්නේ නම් පමණක්, පවතින පුරප්පාඩු සඳහා පහත සඳහන් කාණ්ඩවලට අයත් සිසුන් ලකුණු අනුපිළිවෙළ අනුව තෝරා ගත යුතු ය. (පුරප්පාඩු ලෙස සැලකෙන්නේ ශ්‍රේණියක සිටින මුළු ශිෂ්‍ය සංඛ්‍යාව අදාළ ශ්‍රේණියේ ඇති පන්ති සංඛ්‍යාවෙන් බෙදූ විට ලැබෙන අගය පන්තියක සිටිය යුතු ශිෂ්‍ය සංඛ්‍යාව නො ඉක්මවන්නේ නම් පමණි).

(අ) **පෞද්ගලික වාසස්ථානයෙන් බැහැර ව වාසය කිරීමට සිදු වන පාර්ලිමේන්තුවට තේරී පත් වූ මහජන නියෝජිතයින්ගේ දරුවන් (පාසල අයත් පෝෂිත ප්‍රදේශයේ පදිංචිය සනාථ කළ යුතු ය).**

(ආ) **රාජකාරි අවශ්‍යතා මත පෙර සේවා ස්ථානයේ සිට කි.මී. 50 ට වඩා වැඩි දුරක පිහිටි සේවා ස්ථානයකට මාරුවීමක් ලබා නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමෙන් පසු, තම පවුලේ සාමාජිකයන් සමග (සිසුවා ද ඇතුළුව) එම ප්‍රදේශයේ පාසලට ආසන්න ස්ථානයකට පදිංචියට පැමිණ සිටින රජයේ ආයතන/ සංස්ථා/ රාජ්‍ය බැංකු නිලධරයන්ගේ දරුවන්.**

මේ සඳහා ඉල්ලුම් කළ හැක්කේ නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගත් දින සිට වර්ෂ 03ක කාලයක් තුළ පමණි.

★මෙහි දී නව සේවා ස්ථානය සහ නව පදිංචි ස්ථානය පාසල අයත් පෝෂිත ප්‍රදේශය තුළ විය යුතු ය.

(ඇ) **විදේශගත ව සිට අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ආසන්න වර්ෂ 03 තුළ දිවයිනට පැමිණ පාසල අයත් පෝෂිත ප්‍රදේශයේ පදිංචි ව සිටින දෙමව්පියන්ගේ දරුවන්.**

I. රජයේ අවශ්‍යතා මත රැකියා හෝ ශිෂ්‍යත්ව හෝ අධ්‍යයන කාර්යයන් සඳහා වසරකට නො අඩු කාලයක් විදේශගත ව සිටි දෙමාපියන් / මව/ පියා/ නීත්‍යානුකූල භාරකරු සමග විදේශගත ව වාසය කර ඔවුන් සමග ආපසු දිවයිනට පැමිණි දරුවන්.

II. පෞද්ගලික අවශ්‍යතා මත වසරකට නො අඩු කාලයක් විදේශගත ව සිට තම දෙමාපියන් / මව/ පියා/ නීත්‍යානුකූල භාරකරු සමග ආපසු පැමිණි දරුවන්.

❖ **විදේශ නිවාඩු අනුමත කර ගෙන විදේශ ගත වන පාසල් සිසුන් සඳහා අදාළ චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතු ය.**

(ඈ) **පෙර පදිංචි ස්ථානයේ සිට කි.මී. 50කට වඩා වැඩි දුරක සිට තම පවුලේ සාමාජිකයන් සමග පාසල අයත් පෝෂිත ප්‍රදේශයට පදිංචිය වෙනස් කර පැමිණ සිටින දෙමව්පියන්ගේ දරුවන්.** (මෙහි දී පදිංචිය වෙනස් කළ බව හේතු සහිත ව සනාථ කළ යුතු ය.)

(ඉ) **රාජකාරි අවශ්‍යතා මත පෙර සේවා ස්ථානයේ සිට කි. මී. 50 ට වඩා වැඩි දුරක පිහිටි සේවා ස්ථානයකට මාරු වීමක් ලැබ, තම පවුලේ සාමාජිකයන් සමග (සිසුවා ද ඇතුළුව) නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමෙන් පසු එම ප්‍රදේශයේ පාසලට ආසන්න ස්ථානයක පදිංචියට පැමිණ සිටින පෞද්ගලික අංශයේ යම් ආයතනයක සේවයේ නිරත වන නිලධරයන්ගේ දරුවන්.**
මේ සඳහා ඉල්ලුම් කළ හැක්කේ නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගත් දින සිට වර්ෂ 03ක කාලයක් තුළ පමණි.

★මෙහි දී නව සේවා ස්ථානය හා නව පදිංචි ස්ථානය පාසල අයත් පෝෂිත ප්‍රදේශය තුළ විය යුතු ය.

(ඊ) පළමු ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීමේ පොරොත්තු ලේඛනවල නම් සඳහන් 2 ශ්‍රේණිය සඳහා අයදුම් කරන අයදුම්කරුවන්ගේ දරුවන් (පළමු ශ්‍රේණියට ඉල්ලුම් කිරීමේ දී ඉදිරිපත් කරන ලද ලිපිනයේ පදිංචිය නැවත සනාථ කර ගැනීමෙන් අනතුරුව) සහ පාසල අයත් පෝෂිත ප්‍රදේශය තුළ පදිංචි **5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව පරීක්ෂණයේ එක් එක් වර්ෂයේ දිස්ත්‍රික් කඩඉම් ලකුණු සීමාව ඉක්මවූ 7 ශ්‍රේණියේ සිට 10 ශ්‍රේණිය දක්වා සිසුන්.**

(උ) වර්තමාන සේවා ආයතනයේ අවම සේවා කාලය වසර 03ක් සම්පූර්ණ කරන ලද, පාසල අයත් පෝෂිත ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය සහිත ඉහත කාණ්ඩවලට අයත් නො වන අනෙකුත් රාජ්‍ය නිලධාරීන්ගේ දරුවන්

- **පෝෂිත ප්‍රදේශය යනු පාසල පිහිටි පරිපාලන දිස්ත්‍රික්කය වේ.** යම් පරිපාලන දිස්ත්‍රික් බල ප්‍රදේශ මායිමක යම් පාසලක් පිහිටා ඇති අවස්ථාවක මායිමේ ඇති අනෙක් පරිපාලන දිස්ත්‍රික්කයේ ආසන්න ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ද අදාළ කර ගත හැකි ය.

3.2 පන්තියක ඇතිවන පුරප්පාඩු පිළිබඳ ව ප්‍රසිද්ධ කිරීම

පාසල්වල විදුහල්පතිවරුන් විසින් සෑම වර්ෂයක ම ජනවාරි, අප්‍රේල්, ජූලි හා ඔක්තෝබර් මාසවල අවසන් දිනට එක් එක් ශ්‍රේණිවල පවතින පුරප්පාඩු ප්‍රමාණය ගණනය කර, ජාතික පාසලක් නම් ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද පළාත් පාසලක් නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද ඒ ඒ ශ්‍රේණියේ සමාන්තර පන්ති ගණන, හා පුරප්පාඩු පිළිබඳව විස්තර ලබා දිය යුතු ය. ජාතික පාසල්වල පුරප්පාඩු පිළිබඳ විස්තර අධ්‍යාපන අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ ද පළාත් පාසල්වල විස්තර ඒ ඒ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවල වෙබ් අඩවි මගින් ද ප්‍රසිද්ධ කරනු ලැබේ. ඊට අමතර ව එක් එක් පාසල් මගින් දැන්වීම් පුවරුවේ හෝ පාසල් වෙබ් අඩවිවල පුරප්පාඩු පිළිබඳ විස්තර අයදුම්පත්‍ර කැඳවීමට පෙර ප්‍රසිද්ධ කළ යුතු ය.

3.3 අයදුම් කිරීමේ කාර්ය පටිපාටිය

(අ) ඉහත 3.1 යටතේ සුදුසුකම් ලබන අයදුම්කරුවන් විසින් මෙම චක්‍රලේඛයේ උපලේඛන අංක 01ට අනුව සකස් කර ගත් අයදුම්පත් අදාළ පාසල්හි විදුහල්පතිවරුන් වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු ය. පාසල් කිහිපයක් ඉල්ලුම් කරන්නේ නම් හෝ එක ම පාසලක් සඳහා කාණ්ඩ කිහිපයක් යටතේ ඉල්ලුම් කරන්නේ නම් වෙන වෙන ම අදාළ පාසල් වෙත අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතු ය.

(ආ) අදාළ අයදුම්පත්‍රයේ අයදුම් කරන මාධ්‍යය පැහැදිලි ව සඳහන් කළ යුතු ය.

3.4 තෝරා ගැනීමේ හා ලකුණු ලබා දීමේ පටිපාටිය

3.4.1 පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩු අයදුම්පත් සංඛ්‍යාවක් ලැබී ඇති පාසල්

(අ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩු වන්නේ නම් සම්මුඛ පරීක්ෂණයකින් කරුණු සනාථ කර ගැනීමෙන් අනතුරු ව පාසලට තෝරා ගත් තාවකාලික ලේඛනය සකස් කර ගත යුතු ය.

(ආ) එම පාසල්වල විදුහල්පතිවරුන්ගේ නිර්දේශ මත අදාළ කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරු ව සිසුන් ඇතුළත් කළ යුතු ය. ජාතික පාසලක් නම් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අනුමත කළ ශිෂ්‍ය නාම ලේඛනයේ පිටපතක් ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද පළාත් පාසලක් නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද යොමු කළ යුතු ය.

3.4.2 පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි අයදුම්පත් සංඛ්‍යාවක් ලැබී ඇති පාසල්

ලැබී ඇති අයදුම්පත් පාසලේ පන්තිවල පවතින පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි වන්නේ නම් පමණක් පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වූ අයදුම්කරුවන් සංඛ්‍යාවක් විදුහල්පති විසින් සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු ය. මෙම චක්‍රලේඛයේ සඳහන් ලකුණු ක්‍රමවේදයට අනුකූල ව පාසල මගින් තාවකාලික ව ප්‍රදානය කරනු ලබන ලකුණු අනුව සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන සංඛ්‍යාව තෝරා ගත යුතු ය.

3.4.3 ඉහත 3.4.1 (අ) සහ 3.4.2 හි සම්මුඛ පරීක්ෂණ සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩල පහත අයුරින් පිහිටුවා ගත යුතු ය.

2 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා පන්තිවලට සිසුන් තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සංයුතිය:

i. පාසලේ විදුහල්පති - (සභාපති)
ii. පාසලේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය/ සහකාර විදුහල්පති - (ලේකම්)
iii. පාසලේ අංශ ප්‍රධානී/ ජ්‍යෙෂ්ඨ ගුරුභවතෙකු - (සාමාජික)

මෙහි දී 2 සිට 4 ශ්‍රේණි සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමේ දී ඉහත අංක III හි සඳහන් සාමාජිකයා ප්‍රාථමික අංශ ප්‍රධානි විය යුතු ය. විදුහල්පති විසින් නම් කරන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතිය ලබාගත යුතු ය. අනුමත නාමලේඛනයෙහි පිටපතක්, ජාතික පාසලක් නම් ජාතික පාසල් අධ්‍යක්ෂ වෙත ද පළාත් පාසලක් නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද යොමු කළ යුතු ය.

3.4.4 පාසල්වලට සිසුන් තෝරා ගැනීමට අදාළ ක්‍රියා පටිපාටිය සම්බන්ධ කාල සීමාවන් පහත පරිදි විය යුතු ය.

(අ) ජනවාරි, අප්‍රේල්, ජූලි හා ඔක්තෝබර් මාසවල අවසන් දිනට පවතින පුරප්පාඩු ප්‍රසිද්ධ කර විදුහල්පති විසින් අයදුම්පත්‍ර කැඳවිය යුතු අතර, අයදුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනය සඳහා අවම වශයෙන් සති දෙකක කාලයක් ලබා දිය යුතු ය.
අයදුම්පත්‍ර කැඳවීම පිළිබඳ තොරතුරු අධ්‍යාපන අමාත්‍යාංශයේ/පළාත්අධ්‍යාපන දෙපාර්තමේන්තුවල/ පාසල්වල වෙබ් අඩවි මගින් හා පාසල් දැන්වීම් පුවරු මගින් ප්‍රසිද්ධ කළ යුතු ය.

(ආ) සිසුන් තෝරා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ වර්ෂයකට සිව් වරක් පෙබරවාරි, මැයි, අගෝස්තු හා නොවැම්බර් මාසයන්හි අවසන් සතිවල දී පැවැත්විය යුතු ය.

(ඇ) පාසල්වල එක් එක් ශ්‍රේණියේ පවතින පුරප්පාඩු සඳහා සිසුන් තෝරා ගැනීමේ දී චක්‍රලේඛයෙහි 3.1හි සඳහන් කාණ්ඩ සඳහා ලද අයදුම්පත් සංඛ්‍යාව පවතින පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩු නම් නියමිත පුරප්පාඩු සංඛ්‍යාව සම්පූර්ණ කිරීම සඳහා ලැබී ඇති වෙනත් අයදුම්පත්‍ර ද සලකා බැලිය හැකි ය.

3.4.5 සම්මුඛ පරීක්ෂණ මගින් 2 ශ්‍රේණියේ සිට 4 ශ්‍රේණිය දක්වා ශ්‍රේණිවලට සිසු සිසුවියන් තෝරා ගැනීමේ දී මෙම චක්‍රලේඛයේ 3.1 හි (අ) කාණ්ඩය හැර සෙසු කාණ්ඩ සඳහා පහත 3.4.5.1 හා 3.4.5.2 හි දක්වා ඇති කරුණු පමණක් සලකා බැලිය යුතුය.

3.4.5.1 පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාව

මෙහි දී පදිංචි ස්ථානයේ සිට පාසල දක්වා ඇති කෙටිම පොදු ප්‍රවාහන මාර්ගය අදාළ කර ගත යුතු ය.

| | |
|---|---|
| කි.මී. 10 ක් ඇතුළත | - ලකුණු 25 |
| කි.මී. 10ට වැඩි කි.මී. 15 දක්වා | - ලකුණු 20 |
| කි.මී. 15ට වැඩි කි.මී. 20 දක්වා | - ලකුණු 15 |
| කි.මී. 20ට වැඩි | - ලකුණු 05 |

**(උපරිම ලකුණු 25)**

3.4.5.2 ඉහත ලකුණු මෙම චක්‍රලේඛයේ 3.1 හි (අ) කාණ්ඩය හැර සෙසු සියලු ම කාණ්ඩවලට පොදු වන අතර, එම ලකුණුවලට අමතර ව අයදුම්කරු විසින් ඉල්ලුම් කරන කාණ්ඩයට අදාළ වන කොටසට පමණක් පහත පරිදි ලකුණු ලබා දිය යුතු ය.

(අ) පාර්ලිමේන්තුවට තේරී පත් වූ මහජන නියෝජිතයින්ගේ දරුවන් තෝරා ගැනීමේ දී අවශ්‍යතාව හා ඉඩ ප්‍රස්ථා පිළිබඳව ද පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාව ද සලකා තීරණ ගත හැකිය.

(ආ) රාජකාරි අවශ්‍යතා මත ස්ථාන මාරු වීම් ලැබූ රජයේ ආයතන/සංස්ථා/රාජ්‍ය බැංකු නිලධරයන්ගේ ස්ථාන මාරු වීමේ ස්වභාවය

| | |
|---|---|
| සේවා අවශ්‍යතාව මත | - ලකුණු 25 |
| වාර්ෂික ස්ථාන මාරු | - ලකුණු 15 |
| වෙනත් | - ලකුණු 10 |

**(උපරිම ලකුණු 25)**

(ඇ) විදේශගත ව සිට නැවත පැමිණ පාසල අයත් පෝෂිත ප්‍රදේශයේ පදිංචි ව සිටින දෙමාපියන්ගේ/ මව/ පියා/ නිත්‍යානුකූල භාරකරුවන්ගේ විදේශගත වීමේ ස්වභාවය

| | |
|---|---|
| ශ්‍රී ලංකා දූත මණ්ඩල/ ශ්‍රී ලංකා රජයේ අවශ්‍යතා සඳහා | - ලකුණු 25 |
| රැකියාවක් සඳහා | - ලකුණු 20 |
| ශිෂ්‍යත්වයක් සඳහා | - ලකුණු 15 |

**(උපරිම ලකුණු 25)**

(ඈ) ස්ථිර පදිංචි ස්ථානය වෙනස් වී ඇති අයදුම්කරුවන්ගේ නව පදිංචි ස්ථානයේ සිට පෙර පදිංචි ස්ථානයට ඇති දුර
(මෙහි දී පදිංචි ස්ථාන දෙක අතර කෙටි ම පොදු ප්‍රවාහන මාර්ගය අදාළ කර ගත යුතු ය.)

| | |
|---|---|
| කි.මී.150 හා ඊට වැඩි නම් | - ලකුණු 25 |
| කි.මී.150ට අඩු කි.මී.100 දක්වා | - ලකුණු 20 |
| කි.මී.100ට අඩු කි.මී.50 දක්වා | - ලකුණු 15 |

**(උපරිම ලකුණු 25)**

(ඉ) රාජකාරි අවශ්‍යතා මත ස්ථාන මාරු වීම් ලැබූ පෞද්ගලික අංශයේ නිලධාරීන්ගේ ස්ථාන මාරු වීමේ ස්වභාවය

| | |
|---|---|
| සේවා අවශ්‍යතාව මත | - ලකුණු 25 |
| වාර්ෂික ස්ථාන මාරු | - ලකුණු 15 |
| වෙනත් | - ලකුණු 10 |

**(උපරිම ලකුණු 25)**

(ඊ) පළමු ශ්‍රේණියේ පොරොත්තු ලේඛනයට අයත් අයදුම්කරුවන්ගේ අදාළ ලේඛනයේ නම සඳහන් වන ස්ථානය (දෙවන ශ්‍රේණිය සඳහා පමණි)

| | |
|---|---|
| මුල් 25% තුළ සිටීම | - ලකුණු 25 |
| මුල් 26% - 50% තුළ සිටීම | - ලකුණු 20 |
| මුල් 51% - 75% තුළ සිටීම | - ලකුණු 15 |
| අවසාන 25% තුළ සිටීම | - ලකුණු 10 |

**(උපරිම ලකුණු 25)**

(උ) මෙම චක්‍රලේඛයේ 3.1 (අ) සිට (ඊ) දක්වා කාණ්ඩවලට අයත් නො වන රාජ්‍ය නිලධරයන්ගේ,

i. රජයේ සේවයේ ස්ථිර සේවා කාලය සඳහා වර්ෂයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 10.

ii. පාසල් අධ්‍යාපනයට සෘජුව ම බලපාන ආයතනයක සේවය කිරීම.

ඉල්ලුම් කරන පාසලේ ම සේවය කරන්නේ නම්,

| | |
|---|---|
| අධ්‍යයන කාර්ය මණ්ඩල | - ලකුණු 15 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩල | - ලකුණු 10 |
| වෙනත් පාසලක සේවය කරන්නේ නම් හෝ අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෙනත් ආයතනයක සේවය කරන්නේ නම් | - ලකුණු 10 |

**(උපරිම ලකුණු 25)**

3.4.6 සම්මුඛ පරීක්ෂණ මගින් 7 ශ්‍රේණියේ සිට 10 ශ්‍රේණිය දක්වා සිසු සිසුවියන් ඇතුළත් කර ගැනීමේ දී මෙම චක්‍රලේඛයේ 3.1 හි (අ) කාණ්ඩය හැර සෙසු කාණ්ඩ සඳහා ඉහත 3.4.5.1 හා 3.4.5.2 හි කරුණුවලට අමතර ව පහත (අ) සිට (ඉ) දක්වා සඳහන් කරුණු ද පදනම් කර ගත යුතු ය.

(අ) සිසුන්ගේ අධ්‍යාපන ප්‍රගතිය:

05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව පරීක්ෂණයේ දී ලබා ගත් ලකුණු:

| | |
|---|---|
| දිස්ත්‍රික් කඩඉම හෝ ඊට වැඩි නම් | - ලකුණු 15 |
| ලකුණු 100ට වැඩි නම | - ලකුණු 12 |
| ශිෂ්‍යත්ව විභාගයේ ලකුණු 70-100 | - ලකුණු 08 |

**(උපරිම ලකුණු 15)**

(ආ) ශිෂ්‍යයා/ ශිෂ්‍යාවගේ වර්තමාන අධ්‍යාපන ප්‍රගතිය:

අවසාන වාර පරීක්ෂණයේ මුළු ලකුණුවල සාමාන්‍යය 70% හෝ ඊට වැඩි - ලකුණු 10
අවසාන වාර පරීක්ෂණයේ මුළු ලකුණුවල සාමාන්‍යය 50% -70 % අතර - ලකුණු 08
අවසාන වාර පරීක්ෂණයේ මුළු ලකුණුවල සාමාන්‍යය 40% -50 % අතර - ලකුණු 05
අවසාන වාර පරීක්ෂණයේ මුළු ලකුණුවල සාමාන්‍යය 40%ට අඩු - ලකුණු 02

**(උපරිම ලකුණු 10)**

(ඇ) ආසන්න වර්ෂ 05ක් තුළ ක්‍රීඩා /නව නිපයුම්/සෞන්දර්ය/ විෂය සමගාමී/ විෂය බාහිර ක්‍රියාකාරකම්:

ආසන්න වර්ෂ 05ක් තුළ උපරිම ජයග්‍රහණ 04ක් පමණක් සලකා බලනු ලැබේ.

අන්තර්ජාතික ජයග්‍රහණ/ සහභාගිත්වය - ලකුණු 20
අන්තර් ජාතික මට්ටමේ එක් ජයග්‍රහණයක් සඳහා ලකුණු 05 බැගින්/ අන්තර්ජාතික මට්ටමේ තරග සහභාගිත්වය සඳහා ලකුණු 4.5 බැගින්

සමස්ත ලංකා / ජාතික මට්ටමේ ජයග්‍රහණ - ලකුණු 16
සමස්ත ලංකා/ ජාතික මට්ටමේ එක් ජයග්‍රහණයක් සඳහා පළමු ස්ථානය සඳහා ලකුණු 04 බැගින්/ දෙවන ස්ථානය සඳහා ලකුණු 03 බැගින්/තෙවන ස්ථානය සඳහා ලකුණු 2.5 බැගින්

පළාත් මට්ටමේ ජයග්‍රහණ සඳහා - ලකුණු 12
පළාත් මට්ටමේ එක් ජයග්‍රහණයක් සඳහා පළමු ස්ථානය සඳහා ලකුණු 03 බැගින්/ දෙවන ස්ථානය සඳහා ලකුණු 2.5 බැගින්/තෙවන ස්ථානය සඳහා ලකුණු 01 බැගින්

කලාප මට්ටමේ ජයග්‍රහණ සඳහා - ලකුණු 08
කලාප මට්ටමේ එක් ජයග්‍රහණයක් සඳහා පළමු ස්ථානය සඳහා ලකුණු 02 බැගින්/ දෙවන ස්ථානය සඳහා ලකුණු 1.5 බැගින්/තෙවන ස්ථානය සඳහා ලකුණු 01 බැගින්

කොට්ඨාස මට්ටමේ ජයග්‍රහණ සඳහා - ලකුණු 06
කොට්ඨාස මට්ටමේ එක් ජයග්‍රහණයක් සඳහා පළමු ස්ථානය සඳහා ලකුණු 1.5 බැගින්/ දෙවන ස්ථානය සඳහා ලකුණු 01 බැගින්/තෙවන ස්ථානය සඳහා ලකුණු 0.5 බැගින්

පාසල් මට්ටමේ ජයග්‍රහණ සඳහා - ලකුණු 04
පාසල් මට්ටමේ එක් ජයග්‍රහණයක් සඳහා පළමු ස්ථානය සඳහා ලකුණු 01 බැගින්/ දෙවන ස්ථානය සඳහා ලකුණු 0.5 බැගින්/තෙවන ස්ථානය සඳහා ලකුණු 0.25 බැගින්

**(උපරිම ලකුණු 20)**

* මෙම ලකුණු ප්‍රදානය කිරීමේ දී එක් තරග ඉසව්වක් සඳහා ලකුණු ලබා දිය යුත්තේ ඉහළ ම මට්ටම සඳහා පමණි.

ඉහත තරඟ පෞද්ගලික ආයතනයක් හෝ සංවිධානයක් මගින් සංවිධානය වූවක් නම් එය අධ්‍යාපන අමාත්‍යාංශය හෝ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් අනුමත වූවක් විය යුතු ය.

(ඇ) නායකත්ව කුසලතා

පාසලේ විවිධ සමිති සංගම්වල ප්‍රධාන නිලයක් දැරීම - ලකුණු 02
ශිෂ්‍ය නායක/ ක්‍රීඩා නායක - ලකුණු 03

**(උපරිම ලකුණු 05)**

විදේශගත කාණ්ඩය සඳහා සුදුසු පරිදි සලකා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මගින් තීරණ ගත යුතු ය.

(ඉ) ඉහත 3.4.5.1 හා 3.4.6 හි කරුණුවලට අමතර ව මෙම චක්‍රලේඛයේ 3.1 හි (ඊ) යටතේ වන පාසල අයත් පෝෂිත ප්‍රදේශයේ පදිංචි පහ ශ්‍රේණියේ ශිෂ්‍යත්ව පරීක්ෂණයේ එක් එක් වර්ෂයේ දිස්ත්‍රික් කඩඉම් ලකුණු සීමාව ඉක්මවූ 7 ශ්‍රේණිය සිට 10 ශ්‍රේණිය දක්වා වූ සිසුන් සඳහා පමණක් පහත කරුණු ද පදනම් කර ගත යුතු ය.

අදාළ වර්ෂයේ පාසල් කඩඉම් ලකුණ හෝ එය ඉක්මවා ඇත්නම් - ලකුණු 25
අදාළ වර්ෂයේ පාසල් කඩඉම් ලකුණට වඩා අඩු නම් - ලකුණු 10

**(උපරිම ලකුණු 25)**

3.5 තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු විශේෂ කරුණු

(අ) පාසල්වල අදාළ ශ්‍රේණියට අයත් (ද්වි මාධ්‍ය පන්ති ද ඇතුළු ව) සමාන්තර පන්ති සියල්ලෙහි සිටිය යුතු මුළු ශිෂ්‍ය සංඛ්‍යාව නො ඉක්මවන පරිදි තෝරා ගැනීම් සිදු කළ යුතු ය. ද්වි මාධ්‍ය පන්ති සඳහා වෙන ම පුරප්පාඩු ගණනය නො කළ යුතු ය.

(ආ) පාසල්වලට සිසුන් තෝරා ගැනීමෙන් අනතුරු ව මාධ්‍යය වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(ඇ) සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන සියලුම තොරතුරු ලේඛන මගින් තහවුරු කරගත යුතු අතර අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට සම්පූර්ණ වී තිබිය යුතු ය. එමෙන්ම, යම් අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු/ ලේඛන සාවද්‍ය බව තහවුරු වුවහොත් එම අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කළ යුතු අතර අදාළ සිසුවා පාසලට තෝරා නො ගත යුතු ය. තෝරා ගෙන ඇත්නම් පාසලට ඇතුළත් කර නො ගත යුතු ය.

(ඈ) පාසලේ පවතින පුරප්පාඩු අනුව තෝරා ගැනීමට සුදුසුකම් ලබන සිසුන්ගේ නම් හා ඔවුන් දැනට ඉගෙනුම ලබන පාසල, ශ්‍රේණිය, සම්මුඛ පරීක්ෂණ ලකුණු සඳහන් ලේඛනයක් සකස් කර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සියලු ම සාමාජිකයන් එහි අත්සන් තැබිය යුතු ය. මෙහි දී සම ලකුණු ලබා ගත් සිසුන් කිහිප දෙනෙකු සිටින්නේ නම් පාසලට ඇති ආසන්නතාව අනුව එම සිසුන් පෙළ ගස්වා අදාළ ලේඛනය පිළියෙල කළ යුතු ය. එම ලේඛනය ජාතික පාසලක් නම් අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද පළාත් පාසලක් නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු ය.

**3.6 ආසන්න අවුරුදු 03 ක් ඇතුළත 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව පරීක්ෂණ ප්‍රතිඵල මත අවම ලකුණු තීරණය වූ, 6 ශ්‍රේණියට ශිෂ්‍යත්වධාරීන් ඇතුළත් කරනු ලබන පාසල්වල 5 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම කිසිසේත් ම නො කළ යුතු ය.**

3.7 පාසල්වල 11 ශ්‍රේණිය සඳහා සිසුන් ඇතුළත් කිරීම අත්‍යාවශ්‍ය හේතුවක් මත හැර සිදු නො කළ යුතු ය. යම් හෙයකින් එසේ සිදු කරන්නේ නම් හේතු සහිත ව පළාත් පාසලක් නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ ද ජාතික පාසලක් නම් ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂගේ ද අනුමැතිය ලබාගත යුතු ය.

3.8 ඉහත 3.1හි සඳහන් කාණ්ඩ යටතේ ප්‍රමාණවත් අයදුම්පත්‍ර සංඛ්‍යාවක් පාසලට යොමු වී නොමැති නම්, පාසල වෙත ලැබී ඇති අනිකුත් අයදුම්පත්‍ර සඳහා සම්මුඛ පරීක්ෂණයට කැඳවිය හැකි ය.

3.9 ඉල්ලුම් කරන කිසිදු පාසලක් නො ලද අවස්ථාවන්හි දී වෙනත් පාසලක් ලබා ගැනීම සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත අයදුම්පත්‍රයක් ඉදිරිපත් කළ යුතු අතර එවැනි අවස්ථාවල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පාසලක් ලබා දිය යුතු ය.

**4.0 හයවන ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම.**

4.1 තම පාසලේ සිසුන් හා පෝෂිත පාසල්වලින් ඇතුළත් වන සිසුන්ට අමතර ව 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්වධාරීන් පාසල්වල 6 ශ්‍රේණියට ඇතුළත් කිරීම පිළිබඳ සියලු විධිවිධාන මෙම අමාත්‍යාංශයේ පාසල් කටයුතු ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් පමණක් සිදු කරනු ලබන බව අවධාරණය කරනු ලැබේ.

4.2 පහ ශ්‍රේණි ශිෂ්‍යත්ව පරීක්ෂණයෙන් ලබා ඇති ලකුණු, සිසුන් සඳහා පාසල් ඉල්ලුම් කරන අනුපිළිවෙළ හා අදාළ විදුහල්වල පවතින පුරප්පාඩු මත ඒ ඒ පාසලට අවම ලකුණක් තීරණය වේ. එසේ තීරණය වූ අවම ලකුණට අනුව පාසල් සඳහා තෝරා එවනු ලබන සියලු ම සිසුන් එම විදුහල්වලට ඇතුළත් කර ගත යුතු වේ. මෙහි දී සිංහල හා දෙමළ මාධ්‍ය සඳහා පමණක් වෙන වෙන ම පුරප්පාඩු ගණනය කරනු ලැබේ.

4.3 සිසුන් ඇතුළත් වීමෙන් පසු ව හෝ ඇතුළත් කිරීමට පෙර කිසියම් හේතුවක් මත එම පාසලට යාමට නො හැකි හෝ වෙනත් අපහසුතා ඇත්නම් තමන්ට සුදුසු පාසලක් ලබා ගැනීම සඳහා එම සිසුන්ගේ දෙමාපියන් විසින් අභියාචනාවක් එම පාසලට ඇතුළත් කර ගැනීමට කැඳවූ දින සිට මසක කාලයක් ඇතුළත දී අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් කටයුතු ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ හැකි ය. (එලෙස අභියාචනා ඉදිරිපත් කරන අවස්ථාවේ දී ශිෂ්‍යයන් අධ්‍යාපනය ලැබීමට අපේක්ෂා කරන මාධ්‍ය සඳහන් කළ යුතු වේ.)

4.4 අභියාචනා මගින් සිසුන්ට පාසල් ලබා දීමට හැකි වන්නේ ඉල්ලුම් කරන පාසලේ අදාළ මාධ්‍යය යටතේ පුරප්පාඩු ඇති වුවහොත් හා එම පාසලට තීරණය වී ඇති අවම ලකුණට සිසුවා ලබා ගත් ලකුණු වැඩි හෝ සමාන වුවහොත් පමණි. එහෙත් පාසලේ පුරප්පාඩු තිබිය දී පාසලේ අවම ලකුණ හෝ අවම ලකුණට වඩා වැඩි ලකුණු ලබා ගත් සිසුන් නො සිටියේ නම් ඊට අඩු ලකුණු ද ලකුණු ප්‍රමුඛතාව අනුව සලකා බලනු ඇත.

4.5 තම විදුහල් වෙත යොමු කරන ලද ශිෂ්‍යත්වධාරීන් ඇතුළත් කර ගැනීමෙන් අනතුරුව යොමු කරන ලද ශිෂ්‍යත්වධාරීන් අතරින් ඇතුළත් වූ සිසුන්, ඇතුළත් නො වූ සිසුන් හා තව දුරටත් ඇතුළත් කර ගැනීමට හැකි ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳ සවිස්තර වාර්තාවක් සති දෙකක් තුළ අධ්‍යාපන අධ්‍යක්ෂ (පාසල් කටයුතු) වෙත ඉදිරිපත් කිරීමට විදුහල්පතිවරුන් විසින් වග බලාගත යුතු වේ.

4.6 පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්වධාරීන් ඇතුළත් කරනු ලබන පාසල්වල නම් කරන ලද පෝෂිත පාසල් තිබේ නම් එම පාසල්වල සිසුන් ද ශිෂ්‍යත්වධාරීන්ගේ ප්‍රධාන ලේඛනයේ සිසුන් ද අභියාචනා මගින් තෝරා ගත් සිසුන් ද ඇතුළත් කිරීමෙන් පසු ව පාසල්වල 6 ශ්‍රේණියේ තවදුරටත් පුරප්පාඩු පවතින්නේ නම් එකී පුරප්පාඩු පිරවීම සඳහා විදුහල්පති විසින් ඉල්ලුම්පත් කැඳවීම කළ යුතු ය. පාසලට ඉදිරිපත් කෙරෙන සියලු ම ඉල්ලුම්පත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද අදාළ වර්ෂයේ 5 ශ්‍රේණි ශිෂ්‍යත්ව විභාගයේ දී ඒ ඒ සිසුන් ලබා ගත් ලකුණු අනුව පෙළ ගස්වා පුරප්පාඩු සංඛ්‍යාව ද පැහැදිලි ව සඳහන් කොට පාසලට තෝරා ගත හැකි සිසුන් සඳහා අමාත්‍යාංශයේ පාසල් කටයුතු ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතිය ලබා ගත යුතු ය. පළාත් පාසල් සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතිය ලබා ගැනීම ප්‍රමාණවත් වේ.

4.7 අනුමැතියට ඉදිරිපත් කරන ලේඛනය පහත සඳහන් ආකෘතියට අනුව ලකුණු ප්‍රමුඛතා අනුව සකස් කර තිබිය යුතු ය.

පාසලේ නම :-

පුරප්පාඩු සංඛ්‍යාව :-

| අනු අංකය | විභාග අංකය | නම හා ලිපිනය | ලකුණු (ප්‍රමුඛතාව අනුව) |
|---|---|---|---|
| | | | |

පාසලට ලැබී ඇති සියලු ම අයදුම්පත් ලකුණු අනුපිළිවෙළින් මෙම ලේඛනයට ඇතුළත් කර ඇති බව සහතික කරමි.

විදුහල්පතිගේ අත්සන .......................................

4.8 (අ) ප්‍රාථමික අංශය නොමැති නම් හා නම් කරන ලද පෝෂිත පාසල් නොමැති කල්හි ආදි ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ගේ දරුවන්ට, අදාළ පාසලේ දැනට අධ්‍යාපනය ලබන සිසු සිසුවියන්ගේ සහෝදර සහෝදරියන්ට හා පාසල පිහිටි අධ්‍යාපන කලාපය තුළ පාසල් අධ්‍යාපනයට සෘජු ව ම බලපාන ආයතනවල සේවය කරන අධ්‍යයන කාර්ය මණ්ඩලවලට අයත් තැනැත්තන්ගේ දරුවන්ට ප්‍රමුඛතාව ලැබෙන පරිදි කණ්ඩායම් තුනට ම අනුග්‍රහයක් ලෙස 6 ශ්‍රේණියට ඇතුළත් වීම සඳහා පාසලේ පුරප්පාඩුවලින් 15% ක් ලබා දිය යුතු ය. එක් එක් ගණයන් යටතේ හිමි වන ප්‍රතිශතයන් පහත දක්වා ඇති පරිදි විය යුතු ය.

| අනු අංකය | ගණය | ප්‍රතිශතය |
|---|---|---|
| 01. | ආදි ශිෂ්‍ය | 7.5% |
| 02. | සහෝදර | 5% |
| 03. | අධ්‍යාපන කලාපය තුළ පාසල් අධ්‍යාපනයට සෘජු ව ම බලපාන ආයතනවල අධ්‍යයන කාර්ය මණ්ඩලවලට අයත් තැනැත්තන්ගේ දරුවන් සඳහා | 2.5% |

(ආ) අයදුම් කරනු ලබන පාසල 5 ශ්‍රේණි ශිෂ්‍යත්ව පරීක්ෂණයෙන් කඩඉම් ලකුණක් තීරණය වන පාසලක් නම් ඉහත අනුග්‍රහයන් සඳහා ඉල්ලුම් කරනු ලබන සිසු සිසුවියන් ශිෂ්‍යත්ව පරීක්ෂණයට පෙනී සිටි පාසල අයත් දිස්ත්‍රික්කයේ අවම ලකුණු සීමාව හෝ ඊට ඉහළ ලකුණු ලබමින් සුදුසුකම් ලබා තිබිය යුතු ය.

(ඇ) එසේ වුව ද එවැනි පාසලක් සඳහා දිස්ත්‍රික් අවම ලකුණු සීමාව ලබා ඇති හෝ අවම ලකුණු සීමාව ඉක්ම වූ සිසු සිසුවියන් ඉල්ලුම් කර හෝ අභියාචනා කර නොමැති අවස්ථාවල දී සහ පාසල් අවම ලකුණු හා දිස්ත්‍රික් අවම ලකුණු සීමාව සමාන වන අවස්ථාවල දී ද නියමිත අනුග්‍රහ සීමා තුළ පාසලේ තවදුරටත් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව අදාළ ගණ යටතේ අයදුම් කර ඇති දිස්ත්‍රික් අවම ලකුණු සීමාව නො ලැබූ සිසු සිසුවියන් ලකුණු පදනම් මත සලකා බැලිය හැකි ය.

4.9 මෙම 15% අනුග්‍රහය ලැබීමට සුදුසුකම් සහිත සිසු සිසුවියන්ගේ අදාළ පාසලට ඇතුළත් කිරීම සඳහා 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව පරීක්ෂණයෙන් පාසල් කඩඉම් ලකුණු නිකුත් වී මසක් ඇතුළත සුදුසුකම් ලබන්නන්ගේ අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් එම විදුහලේ විදුහල්පති විසින් කැඳවා ගත යුතු ය. විදුහල්පති විසින් එසේ තම විදුහලට ලැබෙන ඉල්ලුම්පත් අනුව සුදුසුකම් පරීක්ෂා කර ශිෂ්‍යත්ව පරීක්ෂණයේ ලකුණු ප්‍රමුඛතාව අනුව ගණ සඳහා වෙන් වෙන් ව ලේඛන සකස් කර මෙම අමාත්‍යාංශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ (පාසල් කටයුතු) වෙත පිටපත් දෙකකින් එවිය යුතු ය. ඒ අනුව, නියමිත සීමා තුළ තෝරා ගත යුතු සිසුන්ගේ ලේඛනය අධ්‍යාපන අධ්‍යක්ෂ (පාසල් කටයුතු) විසින් පාසලට යොමු කරනු ඇත. ආදි ශිෂ්‍ය ගණය යටතේ ක්‍රියාකාරී ආදි ශිෂ්‍යයන් සඳහා නියමිත 2.5% තෝරා ගැනීම 2018.12.19 දිනැති ED/01/12/15/02/04 අංක දරන උපදෙස් ලිපිය හා අනෙකුත් උපදෙස් ලිපි පරිදි පාසල් මගින් සිදු කළ යුතු ය.

4.10 රජයේ සේවකයන් පාසල පිහිටි ප්‍රදේශයට ස්ථාන මාරු ලබා පැමිණෙන අවස්ථාවන්හි දී එම නිලධරයන්ගේ දරුවන්ට 6 ශ්‍රේණිය සඳහා ශිෂ්‍යත්ව පරීක්ෂණයේ ලකුණු පාදක කොට පුරප්පාඩු අනුව පාසල් ලබා දෙනු ඇත.

(අ) එසේ නො වන අවස්ථාවන්හි දී අවම ලකුණු සීමා තීරණය නො වූ පුරප්පාඩු සහිත පාසල්වලට ඇතුළත් කළ හැකි ය.

(ආ) යම් තැනැත්තෙකු විදේශයන්හි සේවය කර මෙරටට පැමිණ 6 ශ්‍රේණියට ඇතුළත් වීම සඳහා ඉල්ලුම් කරන අවස්ථාවක දී පහත සඳහන් කරුණු පිළිබඳ ව සැලකිල්ලට ගත යුතු වේ.

i. අදාළ සිසුවා / සිසුවිය විදෙස්ගත වීමට පෙර මෙරට පාසලක ඉගෙනුම ලබා ඇත් ද යන වග හා අධ්‍යාපනය ලබා තිබේ නම් එම පාසලට හෝ ඒ හා සමාන පාසලකට (කඩඉම් ලකුණක් තීරණය නො වන) පුරප්පාඩු ඇත්නම් ඇතුළත් වීමට අවස්ථාව සැලසීම.

ii. මෙරට පාසලක අධ්‍යාපනය ලබා නොමැති විටක දී අදාළ දරුවන්ගේ දැනුම මෙරට 6 ශ්‍රේණියේ දැනුමට සමාන වන බව අවම ලකුණු සීමා තීරණය නො වූ විදුහලේ විදුහල්පති විසින් තහවුරු කර ගැනීමෙන් අනතුරු ව එම විදුහල්වලට පුරප්පාඩු ඇත්නම් පමණක් ඇතුළත් කිරීමට ඉඩකඩ සලසා දීම.

(ඇ) 5 ශ්‍රේණිය දක්වා පමණක් පන්ති ඇති පාසල්වල 5 ශ්‍රේණිය සමත් වන සියලු ම සිසුන්ට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අදාළ ද්විතියික පාසල ලබා දිය යුතු ය.

## 5.0 පොදු කරුණු

(අ) පිළිගත හැකි හේතුවක් නොමැති ව ජාතික පාසලකින් ජාතික පාසලකට සිසුන් ඇතුළත් නො කළ යුතු ය. (5 ශ්‍රේණි ශිෂ්‍යත්වධාරීන් හැර) මේ සම්බන්ධයෙන් යම් කිසි පාසලක ශිෂ්‍යයෙකුට හෝ ශිෂ්‍යාවකට හෝ අසාධාරණයක් වන්නේ යැයි අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් නිගමනය කළ අවස්ථාවක දී ඒ පිළිබඳ ව සුදුසු පරිදි තීරණයක් ගැනීමේ බලය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු ය.

(ආ) ස්වාභාවික ව්‍යසනයක් හෝ වෙනත් ආපදාවක් හේතු කොට ගෙන අවතැන් වූ පවුල්වල දරුවන් පාසල්වලට ඇතුළත් කිරීමේ දී උප්පැන්න සහතික, අස්වීමේ සහතික ආදිය ද නොමැති වූ විට එකී පවුල් ආපදාවනට/ස්වාභාවික ව්‍යසනයකට පත් වූ බවට ග්‍රාම නිලධාරීගේ තහවුරු කිරීම මත හෝ අදාළ කඳවුර භාර නිලධාරීන්ගේ තහවුරු කිරීම මත සලකා බලා සුදුසු පරිදි අදළ ශ්‍රේණියට ඇතුළු කර ගැනීමට කටයුතු කළ යුතු ය. උප්පැන්න සහතික ඉදිරිපත් කළ නො හැකි අවස්ථාවන්හි දී උපන් දිනය සනාථ කිරීම සඳහා දිවුරුම් ප්‍රකාශයක් ලබා ගත හැකි ය. එහෙත්, පසු ව උප්පැන්න සහතිකය ලබා ගත යුතු ය.

(ඇ) රජයේ අනුමත ව්‍යාපෘති යටතේ තමන් පදිංචි නිවස සහිත ඉඩම, ඉඩම් පවරා ගැනීම ආදිය අනුව පාසල් වෙනස් කිරීමට අයදුම් කිරීමේ දී අදාළ ලේඛන මගින් සනාථ කර ගැනීමෙන් අනතුරු ව සුදුසුකම් පරීක්ෂා කර බලා ඇතුළත් කර ගැනීමට කටයුතු කළ යුතු ය.

(ඈ) විධිමත් ලෙස පාසල්වලට ඇතුළත් නො වූ පාසල් යා යුතු වයසේ ළමයින් හා නො විධිමත් අධ්‍යාපන වැඩසටහන යටතේ සාක්ෂරතා පන්තිවලට සහභාගී වී සාක්ෂරතා කුසලතා ලැබූ ළමයින් ඔවුන්ගේ වයස හා ප්‍රවීණතාව සලකා සුදුසු පන්තිවලට ඇතුළත් කර ගැනීමට හැකි ය. සාක්ෂරතා පන්තිවලට හෝ වෙනත් පාසලකට නො ගියත් විදුහල්පති ඇතුළු මණ්ඩලයක් මගින් ළමයා සතු දක්ෂතා පරීක්ෂා කර බලා පුරප්පාඩු අනුව ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු ය. එවැනි ශිෂ්‍යයන් සඳහා උප්පැන්න සහතිකය නැතහොත් ඒ වෙනුවට දිවුරුම් පෙත්සමක් පිළිගත හැකි ය. එයින් පසු ව උප්පැන්න සහතිකයක් ලබා ගත යුතු ය.

(ඉ) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන්ට ලබා දෙන සහනය අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ඒ පිළිබඳව නිකුත් කර ඇති චක්‍රලේඛ විධිවිධානවලට අනුව සිදු කළ යුතු ය.

(ඊ) රජයට පවරා ගන්නා පාසල්වල පුරප්පාඩු පිරවීමේ දී පවරා ගන්නා අවස්ථාවේ තත් පාසලේ සිටි ආගමික සිසු අනුපාතය ගැන සැලකිලිමත් විය යුතු ය. යම් ආගමක එක් කොටසකට වෙන් කරන ලද ප්‍රමාණයට අඩු අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඇති කල්හි එම පුරප්පාඩු සෙසු ආගමික කොටස් අතර අනුපාතික ව බෙදා හැරිය යුතු ය.

**6.0** අධිකරණ තීන්දු හා අනෙකුත් නෛතික ක්‍රියාමාර්ගවලට අනුකූල ව නියම කෙරෙන සිසුන් ඇතුළත් කිරීම මෙන් ම මෙම චක්‍රලේඛයෙන් ආවරණය නො වන යම් විශේෂ හේතුවක් මත ශිෂ්‍යයෙකුගේ දැනට ඉගෙනුම ලබන පාසල වෙනස් කිරීමට අවශ්‍ය වන්නේ නම් ශිෂ්‍යයාගේ අඛණ්ඩ අධ්‍යාපන අවස්ථාව තහවුරු වන පරිදි අවස්ථානුකූල ව තීරණ ගැනීමේ බලය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු ය.

**7.0** **සිසුන් ඇතුළත් කිරීම සඳහා මුදල් සහ වෙනත් ආධාර ලබා ගැනීම තහනම් කිරීම.**

සියලු ම රජයේ පාසල්වලට සිසුන් ඇතුළත් කිරීමේ දී පහසුකම් හා සේවා ගාස්තු, පාසල් සංවර්ධන සමිති සාමාජික මුදල හා අනුමත ගාස්තු හැර වෙනත් ගාස්තු හෝ ආධාර මුදල් හෝ වෙන යම් බඩු බාහිරාදියක් හෝ අය කිරීම/ලබා ගැනීම සම්පූර්ණයෙන් ම තහනම් වේ. සිසුන් ඇතුළත් කිරීමෙන් පසු ද සිසුවා ඇතුළත් කිරීම වෙනුවෙන් එවැනි බලපෑමක් නො කළ යුතු වේ. එලෙස බලපෑම් කිරීම සම්පූර්ණයෙන් ම නීති විරෝධී වන අතර එවැනි පැමිණිලි සම්බන්ධ ව විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට සිදු වනු ඇත. පාසල් ප්‍රධානින් හෝ පාසලට සම්බන්ධ වෙනත් කවර සංවිධානයක් හෝ එලෙස බලපෑම් නො කළ යුතු ය. මෙහි දී සංවිධාන යන්නෙන්, ආදි ශිෂ්‍ය සංගම්, පාසල් සංවර්ධන සමිති ඇතුළු පාසලට සම්බන්ධ සියලු ම සමිති හා සංගම් අදහස් කෙරේ.

මෙම චක්‍රලේඛයෙන් පැනනගින ඕනෑ ම ගැටලුවක් සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

එම්.එන්. රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් :-

1. පළාත් ප්‍රධාන ලේකම්වරුන්
2. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපති
3. විගණකාධිපති
4. ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්
5. විභාග කොමසාරිස් ජනරාල්
6. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
7. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු ම මාණ්ඩලික නිලධාරීන්
8. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු ම ශාඛා ප්‍රධානීන්

උපලේඛන අංක 01

**<u>පාසල්වල 2 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා (6 ශ්‍රේණිය හැර)</u>**

**<u>සිසුන් ඇතුළත් කිරීමේ ආදර්ශ අයදුම් පත්‍රය</u>**

අයදුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනට ඉදිරිපත් කරන සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු අතර එම කරුණු සනාථ කිරීම සඳහා අවශ්‍ය ලේඛනවල පිටපත් සහිත ව මෙම අයදුම්පත්‍රය ඉල්ලුම් කරන පාසලේ විදුහල්පති වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු ය.

**20..... වර්ෂයේ දී ............................................................... විද්‍යාලයේ**

**................ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා අයදුම් පත්‍රය**

- **අයදුම් කරන කාණ්ඩය: විදේශගත වීම්/ ස්ථාන මාරු/පදිංචිය වෙනස් වීම්/ ........................**

**01. ශිෂ්‍යයා / ශිෂ්‍යාව පිළිබඳ විස්තර :-**

1.1 සම්පූර්ණ නම : ........................................................................................

(වාසගමට යටින් ඉරක් අඳින්න.)

1.2 මුලකුරු සමඟ නම (සිංහලෙන්/ දෙමළෙන්) : ........................................

(අගට යෙදෙන එක් නමක් පමණක් ලියන්න. උදා - ඩබ්ලිව්.ඒ.සී.ඩී. විජේරත්න)

1.3 මුලකුරු සමඟ නම (ඉංග්‍රීසියෙන්) : ..................................................

(අගට යෙදෙන එක් නමක් පමණක් ලියන්න. (උදා:- W.A.C.D. Wijerathna)

1.4 ස්ත්‍රී/ පුරුෂ භාවය : .........................................................................

1.5 ආගම : ...............................................................................................

1.6 ඉගෙනුම් මාධ්‍යය:.......................................................

1.7 උපන්දිනය : අවුරුද්ද ............ මාසය ............ දිනය ............

1.8 20...... ජනවාරි මස 31 දිනට වයස : අවුරුදු........... මාස ...........දින ...........

1.9 දැනට ඉගෙනුම ලබන පාසල හා ශ්‍රේණිය: ..........................................................

**02. අයදුම්කරු පිළිබඳ විස්තර :- (මව/ පියා/නිත්‍යානුකූල භාරකරු)**

2.1 සම්පූර්ණ නම :

..........................................................................................................

..........................................................................................................

2.2 මුලකුරු සමඟ නම :

..........................................................................................................

..........................................................................................................

2.3 ජාතික හැඳුනුම්පත් අංකය :.........................................................

2.4 ශ්‍රී ලාංකිකයෙක් ද :...........................

2.5 ආගම : ......................................

2.6 ස්ථිර ලිපිනය

:...........................................................................................................................

...........................................................................................................................

2.7 දුරකථන අංකය : ....................................

2.8 දැනට පදිංචි ව සිටින දිස්ත්‍රික්කය : ....................................

2.9 දැනට පදිංචි ස්ථානයට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :

....................................................

2.10 දැනට පදිංචි ස්ථානයට අදාළ ග්‍රාම නිලධාරී වසම: .......................... අංකය : .......

2.11 දැනට පදිංචි වී සිටින ස්ථානයේ ලිපිනය:

.......................................................................................

.......................................................................................

2.12 පදිංචිය වෙනස් කර ඇත්නම් පෙර පදිංචි වී සිටි ස්ථානයේ ලිපිනය:

.............................................................................................................................................

.................................................................................................

**03.** **ඉල්ලුම් කරන වෙනත් පාසල් :**

| අනු අංකය | පාසලේ නම | පාසල් වර්ගය (ජාතික/ පළාත්) |
|---|---|---|
| **01.** | | |
| **02.** | | |
| **03.** | | |
| **04.** | | |

**04.** පහත සඳහන් කොටස්වල තමා ඉල්ලුම් කරන ගණයට අදාළ කොටස් පමණක් සම්පූර්ණ කරන්න.

<table>
<tr><th>කරුණු</th><th>ලකුණු (කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)</th></tr>
<tr><td>4.1 පාර්ලිමේන්තුවට තේරී පත් වූ මහජන නියෝජිතයන්ගේ දරුවන්<br><br>4.1.1 පදිංචි ස්ථානයේ සිට පාසල දක්වා ඇති දුර.................<br>(කෙටිම පොදු ප්‍රවාහන මාර්ගය අනුව කිලෝමීටරවලින්)<br><br>4.1.2 සිසුවා දැනට ඉගෙනුම ලබන පාසල වෙනස් කිරීමට හේතුව:<br>..............................................................................................</td><td></td></tr>
<tr><td>4.2 රාජකාරී අවශ්‍යතා මත පෙර සේවා ස්ථානයේ සිට කි.මී.50 ට වඩා වැඩි දුරක පිහිටි සේවා ස්ථානයකට මාරුවීමක් ලබා, තම පවුලේ සාමාජිකයන් සමඟ නව සේවා ස්ථානය පිහිටි ප්‍රදේශයේ පදිංචියට පැමිණ සිටින රජයේ ආයතන/සංස්ථා/රාජ්‍ය බැංකු නිලධරයන්ගේ දරුවන්ගේ කාණ්ඩය<br><br>4.2.1 අවසානයට ස්ථාන මාරුවීම් ලැබ නව සේවා ස්ථානයේ වැඩ භාරගත් දිනය: ...............................<br>4.2.2 ස්ථාන මාරු වීමට අදාළව නව සේවා ස්ථානයේ නම හා ලිපිනය:<br>..............................................................................................<br>..............................................................................................<br>..............................................................................................<br>4.2.3 ස්ථාන මාරු වීමට අදාළව පෙර සේවා ස්ථානයේ නම හා ලිපිනය:<br>..............................................................................................<br>..............................................................................................<br>..............................................................................................<br>4.2.4. පෙර සේවා ස්ථානයේ අඛණ්ඩ සේවා කාලය:<br>........................සිට.......................දක්වා<br>4.2.5 ස්ථාන මාරුවීම් ලැබ අයදුම්පත් ඉදිරිපත් කරන දිනට ගත වූ කාලය:<br>අවුරුදු ............. මාස.......... දින .......<br>4.2.6 ස්ථාන මාරුවීම් ලැබ පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති දුර ................<br>(කෙටිම පොදු ප්‍රවාහන මාර්ගය අනුව කිලෝමීටරවලින්)<br><br>4.2.7 ස්ථාන මාරු වීමට හේතුව: (සේවා අවශ්‍යතා මත / වාර්ෂික ස්ථාන මාරු / වෙනත් යන්න සඳහන් කරන්න)<br>..............................................................................................<br>..............................................................................................<br>..............................................................................................</td><td></td></tr>
</table>

**4.3 විදේශ ගත ව සිට පැමිණ පාසල අයත් පෝෂිත ප්‍රදේශයේ පදිංචි ව සිටින දෙමාපියන්ගේ දරුවන්ගේ කාණ්ඩය**

4.3.1 විදේශගත ව සිට නැවත දිවයිනට පැමිණි දිනය: ........................

4.3.2 ළමයා සමඟ අඛණ්ඩ ව විදේශගත ව සිටි කාලය:
............. දින සිට ....................දින දක්වා

4.3.3 විදේශ ගත වූ හේතුව: ..............................................................
..................................................................................
..................................................................................

4.3.4. පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති දුර:.......................
(කෙටිම පොදු ප්‍රවාහන මාර්ගය අනුව කිලෝමීටරවලින්)

**4.4 යම් කිසි හේතුවක් මත පෙර පදිංචි ස්ථානයේ සිට කි.මී. 50කට වඩා වැඩි දුරක සිට පවුලේ සාමාජිකයන් සමඟ පාසල අයත් පෝෂිත ප්‍රදේශයට පිහිටි ප්‍රදේශයට පදිංචිය වෙනස් කර පැමිණ සිටින දෙමව්පියන්ගේ දරුවන්ගේ කාණ්ඩය**

4.4.1 පදිංචිය වෙනස් කිරීමට හේතුව:..........................................................

4.4.2 පදිංචිය වෙනස් කර නව පදිංචි ස්ථානයට පැමිණි දිනය:.........................

4.4.3 පෙර පදිංචි ස්ථානයේ ලිපිනය: ..........................................................
..................................................................................

4.4.4 නව පදිංචි ස්ථානයේ ලිපිනය: ..........................................................
..................................................................................

4.4.5 නව පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති දුර:......................................
(කෙටිම පොදු ප්‍රවාහන මාර්ගය අනුව කිලෝමීටරවලින්)

4.4.6 නව පදිංචි ස්ථානයේ සිට පෙර පදිංචි ස්ථානයට ඇති දුර:........................
(කෙටිම පොදු ප්‍රවාහන මාර්ගය අනුව කිලෝමීටරවලින්)

| | |
|---|---|
| **4.5 රාජකාරී අවශ්‍යතා මත පෙර සේවා ස්ථානයේ සිට කි.මී.50 ට වඩා වැඩි දුරක පිහිටි සේවා ස්ථානයකට මාරුවීමක් ලබා, තම පවුලේ සාමාජිකයන් සමඟ නව සේවා ස්ථානය පිහිටි ප්‍රදේශයේ පදිංචියට පැමිණ සිටින පෞද්ගලික අංශයේ ආයතනයක සේවයේ නිරත නිලධරයන්ගේ දරුවන්ගේ කාණ්ඩය**<br><br>4.5.1 අවසානයට ස්ථාන මාරුවීම් ලැබ නව සේවා ස්ථානයේ වැඩ භාරගත් දිනය: ...............................<br>4.5.2 ස්ථාන මාරු වීමට අදාළව නව සේවා ස්ථානයේ නම හා ලිපිනය:<br>..........................................................................................................<br>4.5.3 ස්ථාන මාරු වීමට අදාළව පෙර සේවා ස්ථානයේ නම හා ලිපිනය:<br>..................................................................................................<br>4.5.4. පෙර සේවා ස්ථානයේ අඛණ්ඩ සේවා කාලය:<br>........................සිට.......................දක්වා<br>4.5.5 ස්ථාන මාරුවීම් ලැබ අයදුම්පත් ඉදිරිපත් කරන දිනට ගත වූ කාලය:<br>අවුරුදු ............. මාස.......... දින ......<br>4.5.6 ස්ථාන මාරුවීම් ලැබ පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති දුර: ................<br>(කෙටිම පොදු ප්‍රවාහන මාර්ගය අනුව කිලෝමීටරවලින්)<br>4.5.7 ස්ථාන මාරු වීමට හේතුව: (සේවා අවශ්‍යතා මත / වාර්ෂික ස්ථාන මාරු / වෙනත් යන්න සඳහන් කරන්න)<br>.................................................................................................... | |
| **4.6 පළමු ශ්‍රේණියේ පොරොත්තු ලේඛනවල නම් සඳහන් අයදුම්කරුවන්ගේ දරුවන්ගේ කාණ්ඩය (2 ශ්‍රේණිය සඳහා පමණි.)**<br><br>4.6.1 ඉල්ලුම් කරන පාසලේ පළමු ශ්‍රේණියේ අවසන් පොරොත්තු ලේඛනයේ නම සඳහන් වන්නේ ද :...................................<br>4.6.2 අවසන් පොරොත්තු ලේඛනයට අයත් ගණය :....................................<br>4.6.3 අවසන් පොරොත්තු ලේඛනයේ ස්ථානය : ..........................................<br>4.6.4 පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති දුර :.................................................<br>(කෙටිම පොදු ප්‍රවාහන මාර්ගය අනුව කිලෝමීටරවලින්) | |

**4.7 පාසල අයත් පෝෂිත ප්‍රදේශය තුළ පදිංචි පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව පරීක්ෂණයේ දිස්ත්‍රික් ලකුණු සීමාව ලබා ගත් හෝ එම සීමාව ඉක්මවූ සිසුන් (7 ශ්‍රේණියේ සිට 10 ශ්‍රේණිය දක්වා පමණක් අදාළ වේ.)**

4.7.1 ශිෂ්‍යත්ව පරීක්ෂණයට පෙනී සිටි වර්ෂය ..........................................
..........................................................................................

4.7.2 ශිෂ්‍යත්ව පරීක්ෂණයට පෙනී සිටි පාසල අයත් දිස්ත්‍රික්කය :..................

4.7.3 ශිෂ්‍යත්ව පරීක්ෂණයෙන් ලබා ඇති ලකුණු :........................................

4.7.4 පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති දුර :...................
(කෙටිම පොදු ප්‍රවාහන මාර්ගය අනුව කිලෝමීටරවලින්)

**4.8 වර්තමාන සේවා ආයතනයේ අවම සේවා කාලය වසර 03ක් සම්පූර්ණ කරන ලද, පාසල අයත් පෝෂිත ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය සහිත ඉහත කාණ්ඩවලට අයත් නොවන අනෙකුත් රාජ්‍ය නිලධාරීන්ගේ දරුවන් සඳහා වන කාණ්ඩය**

4.8.1 රැකියාව :..........................................................................................
වර්තමාන සේවා ස්ථානයේ නම හා ලිපිනය :........................................
..........................................................................................

4.8.2 වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය :........................................

4.8.3 රාජ්‍ය සේවයේ ස්ථිර සේවා කාලය :..................................................

4.8.4 පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති දුර:..............................
(කෙටිම පොදු ප්‍රවාහන මාර්ගය අනුව කිලෝමීටරවලින්)

**ඉහත එක් එක් කාණ්ඩයට අදාළ කොටසට අමතර ව පහත 4.9 හා 4.10 හි කරුණු 7 ශ්‍රේණියේ සිට 10 ශ්‍රේණිය දක්වා පන්තිවලට පමණක් අදාළ වේ.**

**4.9 සිසුන්ගේ අධ්‍යාපන ප්‍රගතිය**

(අ) ශිෂ්‍යයා/ශිෂ්‍යාව 05 ශ්‍රේණි ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින ලද්දේ නම්,

අදාළ වර්ෂය:- ............................ ලබා ගත් ලකුණ:-..............................

(ආ) ශිෂ්‍යයා/ ශිෂ්‍යාවගේ වර්තමාන අධ්‍යාපන ප්‍රගතිය

අවසාන වාර පරීක්ෂණයෙන් ලබා ගත් මුළු ලකුණු ප්‍රමාණය :-.......................

අවසාන වාර පරීක්ෂණයේ මුළු ලකුණුවල සාමාන්‍යය :- ............................

**4.10 ආසන්න වර්ෂ 03ක් තුළ ක්‍රීඩා/ සෞන්දර්ය/ නව නිපැයුම්/ විෂය සමගාමී හා විෂය බාහිර ක්‍රියාකාරකම්**

- **ක්‍රීඩා සඳහා ලබා ගත් ජයග්‍රහණ**

| ක්‍රීඩා තරගය | ඒකල/සමූහ | ජයග්‍රහණය ලද වර්ෂය | අදාළ ආයතනය | ලබා ඇති ජයග්‍රහණ | | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |
|---|---|---|---|---|---|---|
| | | | | පාසල්/කොට්ඨාස /කලාප/පළාත්/ ජාතික/ අන්තර්ජාතික | 1/2/3/ (අන්තර්ජාතික සහභාගිත්ව) | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

- **සෞන්දර්ය සඳහා ලබා ගත් ජයග්‍රහණ**

| සෞන්දර්ය තරගය | ඒකල/සමූහ | ජයග්‍රහණය ලද වර්ෂය | අදාළ ආයතනය | ලබා ඇති ජයග්‍රහණ | | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |
|---|---|---|---|---|---|---|
| | | | | පාසල්/කොට්ඨාස /කලාප/පළාත්/ ජාතික/ අන්තර්ජාතික | 1/2/3/ (අන්තර්ජාතික සහභාගිත්ව) | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

- **නව නිපැයුම් සඳහා ලබා ගත් ජයග්‍රහණ**

| නව නිපැයුම | ජයග්‍රහණය ලද වර්ෂය | අදාළ ආයතනය | ලබා ඇති ජයග්‍රහණ | | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |
|---|---|---|---|---|---|
| | | | පාසල්/කොට්ඨාස/ කලාප/පළාත්/ ජාතික/ අන්තර්ජාතික | 1/2/3/ (අන්තර්ජාතික සහභාගීත්වය) | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

- **විෂය සමගාමී හා විෂය බාහිර ක්‍රියාකාරකම්**

| ක්‍රියාකාරකම් | වර්ෂය | ලබා ඇති ජයග්‍රහණ (පාසල්/කොට්ඨාස/කලාප/පළාත්/ ජාතික/අන්තර්ජාතික) | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |
|---|---|---|---|
| | | | |
| | | | |

| | | | |
|---|---|---|---|
| | | | |
| | | | |

- **නායකත්ව කුසලතා**

| අදාළ සංගමය/සමිතිය/ශිෂ්‍ය නායක/ ක්‍රීඩා නායක | තනතුර | වර්ෂය | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

**ප්‍රකාශය**

මෙහි ඉහත සඳහන් කරනු ලැබූ තොරතුරු සත්‍ය බවත්, මවිසින් මෙහි සඳහන් කළ ස්ථිර පදිංචිය හා අනෙකුත් තොරතුරු පිළිබඳ සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කිරීමට එකඟ වන බවත් ප්‍රකාශ කරමි. මවිසින් සඳහන් කරන ලද යම් තොරතුරක් අසත්‍ය/ කූට බව හෙළි වුවහොත් මාගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලබන බවත් මම දනිමි. මාගේ ළමයා පාසලට ඇතුළත් කළ පසු තොරතුරු අසත්‍ය/කූට බව හෙළි වුවහොත් ඔහු/ ඇය පාසලෙන් ඉවත් කර ගෙන පළාත්/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නම් කෙරෙන එම ප්‍රදේශයේ වෙනත් පාසලකට ඇතුළත් කිරීමට මම එකඟ වෙමි.

............................ ......................................................

දිනය මවගේ/ පියාගේ/ නිත්‍යානුකූල භාරකරුගේ අත්සන